**1 සතිය**

**III වන වාරය - පළමු සතිය - 2021 - අගෝස්තු 30-2021**

**9 ශ්‍රේණිය - ඉතිහාසය**

**තෙවන වාරය - 2020 - සති පාසල් පැවරුම් අංක -01**

**කොවිඩ් 19 - සබරගමුව සති පාසල්**

**විශේෂ පුනරීක්ෂණ පැවරුම් අංක -01**

- තෙවන වාරයට අදාළ විෂය කරුණු ආවරණය කිරීමට ලබාදෙන පැවරුම් ආරම්භයට පෙර පළමු හා දෙවන වාරවල අවසන් වූ පාඩම් ආවරණය වනලෙස සැකසුන ප්‍රශ්නාවලිය.
- සිසුන් හට උපදෙස් :-
  - පහතින් දක්වා ඇති ප්‍රශ්න සඳහා තම සටහන් පොතෙහි පිළිතුරු සපයන්න
  - එහිදි ප්‍රශ්නය ලියා නැවත පිළිතුර ලිවිම අත්‍යවශ්‍ය වේ.
  - මෙමඟින් පසුගිය විෂය කොටස් නැවත ආවර්ජනය කිරීම අපේක්ෂා කෙරේ.

❖ <u>ප්‍රශ්නාවලිය</u>

1. ලංකාවට පැමිණි මුල්ම දූත කණ්ඩායම දෙක කුමක්ද?
2. ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම හැඳින් වූ කෙටි නාමය දක්වන්න.
3. 1938 දී ලන්දේසින් සමඟ ගිවිසුම්ගත වූ උඩරට රජු කව්ද?
4. එම ගිවිසුමේ අන්තර්ගත කරුණු දෙකක් ලියන්න.
5. ක්‍රි.ව. 1656 වර්ෂයේ ජෙනරාල් පෙරාඩ් හල්ෆ්ට්ගේ දූතගමනේදී ලන්දේසින් රජුට ලබා දුන් ත්‍යාග මොනවාද?.
6. දිවයිනේ ලන්දේසි යටතේ පාලනය වූ ප්‍රධාන කොටස් 03 නම් කරන්න.
7. ලන්දේසින් විසින් හදුන්වාදුන් නීති ක්‍රමය තුළ ඇති වූ උසාවි තුනක් දක්වා ඒවාට පැවරුණ කාර්යන් ලියා දක්වන්න.
8. ලන්දේසින් සිය ආදායම ඉහල නංවාගැනීමට අනුගමනය කල ක්‍රියාමාර්ග තුනක් දක්වන්න.
9. ඉංග්‍රීසින් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක තුනක් නම් කරන්න.
10. ඉංග්‍රීසින් උඩරට සමඟ ඇති කරගත් දූත සබදතාවල ප්‍රධනීන් වුයේ කවුරුන්ද?
11. 1796 සිට 1815 දක්වා උඩරට රාජධානිය යටත් කර ගැනිම දක්වා මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලනයේ කැපීපෙනෙන අවස්ථා තුන ලියා දක්වන්න.
12. 1797 මුහුදුබඩ ප්‍රදේශයේ ඇතිවූ කැරැල්ලට බලපෑ හේතු තුනක් දක්වන්න.
13. 1815 උඩරට ගිවිසුමේ 5වන වගන්තියේ අන්තර්ගතය කුමක්ද?
14. 1818 නිදහස් සටනට හේතු වූ ප්‍රධාන සාධකය හා තවත් කරුණු තුනක් ලියා දක්වන්න.
15. 1818 නිදහස් සටනේ නායකයින් තිදෙනෙක් ලියා දක්වන්න.
16. 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ සාධක තුනක් දක්වන්න.
17. 1818 නිදහස් සටනට බලපෑ බදු වර්ග තුනක් දක්වන්න.

18. 1848 නිදහස් සටනේ නායකයින් තිදෙනෙකු දක්වන්න.
19. බ්‍රිතාන්‍යයන් විසින් 1833 ඇතිකල කෝල්බෲක් කොමිසම් යෝජනා තුළ අන්තර්ගත වූ ආර්ථික ලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල පරිපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණ තුන බැගින් දක්වන්න.
20. කෝල්බෲක් යෝජනා තුළ වූ පෞද්ගලික ව්‍යාපාරික අරමුණු වලට ගැළපෙන ලෙස සකස්කල ප්‍රතිපත්ති තුනක් දක්වන්න.
21. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට හඳුන්වාදුන් ආර්ථික බෝග මොනවාද?
22. තේ වගාවේ උන්නතියට බලපෑ හේතු සාධක තුනක් දක්වන්න.
23. රබර් වගාවේ දියුණුවට හේතු වූ කරුණු තුනක් දක්වන්න.
24. 1840 ඇති කළ මුඩුබිම් පනත යනු කුමක්ද?
25. සමුපකාරසමිති ආරම්භකිරීම මඟින් බලාපොරොත්තු වූ අරමුණු තුනක් දක්වන්න.
26. ලංකාවට පැමිණි මිෂනාරී සංවිධාන තුනක් ලියා දක්වන්න.
27. මිෂනාරිවරුන් ආගම ප්‍රචාරය කිරීමට අනුගමනය කළ ප්‍රධන ක්‍රියාකාරකම් මොනවාද?
28. බෞද්ධ පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ 04 ක් දක්වන්න.
29. බෞද්ධ පුනරුදය තුළ එළිදැක්වූ බෞද්ධ ප්‍රකාශන තුනක් දක්වන්න.
30. හින්දු පුනර්ජීවනයේ පුරෝගාමියා වූයේ කවුද?

❖ ලබන සතියේ සිට තුන්වන වාරය සඳහා අදාළ විෂය ඒකක ආවරණය වන ලෙස පැවරුම් සකස් වේ .ඒ සඳහා ඔබ සූදානම් වන්න.

සැකසුම :- උදාර අරවින්ද - නිවිතිගල කලාපය- ර/නිවි/කලවාන ජාතික පාසල